ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2024.02.10

පී.ජී.ආර්.බී.එස්. බණ්ඩාර මයා,
E-239/2, සූරියමල්ගම,
උඩුගොඩ.

පැමිණිලිකාර පාර්ශවය

ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
බුලත්කොහුපිටිය.

වගඋත්තරකාර පාර්ශවය

**පැමිණිලි අංකය: HRC/1311/24**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

උක්ත පැමිණිලිකරු තමා පදිංචිව සිටි ඉහත ලිපිනය දරන නිවසෙහිදී බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති මගින් අත්අඩංගුවට ගැනීමක් සිදුකොට ස්ථානයේ සිරමැදිරියට ඇතුලු කිරීම හා පහරදීම මගින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට 2024.04.01 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත. මෙහිදී පැමිණිලිකාර පාර්ශවය වැඩිදුරටත් කියා සිටින්නේ ඉහත ලිපිනය දරන නිවසේ තම මාමා සහ නැන්දා සමඟ කුඩා කල සිට රැකියාවක් ලැබෙන තෙක් තමා පදිංචිව සිට ඇති බවත්, එම දෙපළගේ අභාවයෙන් පසු මෙම දේපළ සම්බන්ධයෙන් පවුලේ ඥාතීන් අතර ආරාවුලක් ඇතිවූ බවත් ය. එම නිවසේ තම නැන්දාගේ මරණයෙන් පසුව සිදුවූ සත් දින දානමය පිංකම සිදුකළ අවස්ථාවේදී නැන්දාගේ සහෝදරයෙකු වූ ඩබ්. ජයතිලක යන අය සමඟ ආරාවුලක් ඇති වූ බවත්, ඒ සම්බන්ධයෙන් ඩබ්. ජයතිලක යන අය පොලිස් හදිසි ඇමතුම් අංකය වන 119 අංකයට දුරකථන ඇමතුමක් ලබා දී ඇති බවත්, ඒ අනුව පැමිණි බුලත්කොහුපිටිය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මංජුල රුවන්තිලක මහතා විසින් දානය සඳහා සහභාගි වූ පිරිස් පළවා හැර නිවසේ දොර වසා යතුරු ඔහුට භාරදෙන ලෙස තමා හට නියෝග කළ බවත්, එහිදී තමා මහත් අපහසුතාවයට පත් වූ බවත්, ඒ අනුව තමා හට නිවසේ දොරගුළුලා යතුර ස්ථානාධිපති හට ලබාදීමට සිදුවූ බවත් පැමිණිලිකරු පැමිණිල්ල මගින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එසේම, එම කාරණාව සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයා විසින් කිසිදු වග විභාගයක් නොපවත්වා එම නිවසේ හිමිකම් ඇතැයි පවසන වයස අවුරුදු 11ක් වයසැති තරුෂ අතුකෝරල නමැති දරුවා වෙත යතුර භාර දුන් බවත්, ඔහුට නිවසේ රැඳී සිටින ලෙසට නියෝග කර ඇති බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. තවද, එම දේපළෙහි හිමිකම සම්බන්ධයෙන් බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් 66 වගන්තිය යටතේ කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පැවරූ අංක 26712/23 දරන නඩුව සඳහා පෙනී සිටින ලෙස දැනුම් දෙන ලද බවත්, එකී නඩුවට අදාළව 2024.02.19 වන දින නියෝගයක් ප්‍රකාශයට පත් කර ඇති බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. එසේම, එම නියෝගය ප්‍රකාරව ඉහත කී අවුරුදු 11ක් වයසැති දරුවාට නිවසේ හිමිකමක් නොමැති බවත්, එම දෙපාර්ශවය සමගියෙන් සිටිය යුතු බවත්, මේ සම්බන්ධව සිවිල් අධිකරණයක් මගින් දේපළ අයිතිය සම්බන්ධ ගැටලුව නිරාකරණය කරගන්නා ලෙසත් නියෝග කර බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රය නිෂ්ප්‍රභා කර ඇති බවත් පැමිණිල්ල මගින් කරුණු දක්වා ඇත.

එසේම, මෙහිදී 2024.02.25 දින තමා විසින් ඉහත සඳහන් තමා හිමිකම් දරන නිවස වෙත ගිය අවස්ථාවේදී එහි ඒ වනවිට පදිංචිව සිටි තරුෂ අතුකෝරාල යන එකොළොස් වියැති දරුවා හා ඔහුගේ මව වන චන්ද්‍රිකා කුමාරි නමැති අය නිවසේ නොසිටි බවත්, ඔවුන්ගේ වැඩිමහල් පිරිමි දරුවා වන ඒ. කේ. ගයාන් නමැති අය පමණක් නිවසේ සිටි බවත් පැමිණිලිකරු සඳහන් කර ඇත. එම අවස්ථාවේදී ඒ.කේ. ගයාන් නමැති අයගේ දැනුම්දීම මත එදින පස්වරු 1.30ට පමණ තරුෂ අතුකෝරාල හා ඔහුගේ මව එම ස්ථානයට පැමිණි බවත්, එහිදී ඔවුන් හට එම නිවසේ අයිතියක් නොමැති බවත්, මළගෙදරට පැමිණි ඥාතියෙකු වන ඩබ්. ජයතිලක යන අය ඔවුන්ව අනවශ්‍ය ප්‍රශ්නයකට ඇද දමා ඇති බවත්, ඔවුන් සතු වෙනත් නිවසක් සඳහා යෑමට අවශ්‍ය බව දන්වා සියලු ඇඳුම් පැළඳුම් සූදානම් කරගත් බවත්, ඩබ්. ජයතිලක යන අයට දැනුම් දී ඔහු සතු ත්‍රීරෝද රථය රැගෙන එන තෙක් බලා සිට ත්‍රීරෝද රථය ආ විට ඔවුන් නිවසින් පිටව යන බව ප්‍රකාශ කළ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එසේම, ඔවුන් පිටව යාමට පෙර එදින එනම්, 2024.02.25 දින රාත්‍රී 7.00ට පමණ බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ නිලධාරියකු හා තවත් සිවිල් ඇඳුමෙන් සැරසුණු තිදෙනෙකු ඉහත කී තමා සිටි නිවසට පැමිණි බවත්, එම නිලධාරීන් පැමිණ එම නිවසේ පදිංචිව සිටි කුඩා දරුවා සහ ඔහුගේ මව බලෙන් නෙරපා හැරියේදැයි තමාගෙන් විමසූ බවත්, ඒ අවස්ථාවේ තමා එසේ නොකළ බව සහ සිදුවූ කාරණාව එම නිලධාරීන් වෙත ප්‍රකාශ කර සිටි බවත් පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් සඳහන් කර ඇත. ඒ අනුව එම කාරණාව සම්බන්ධයෙන් විමසා සිටි නිලධාරීන් ඉදිරියේදීම ඉහත කී චන්ද්‍රිකා කුමාරි යන අය දරුවන් දෙදෙනා සමඟ ඔවුන් සතු ඇඳුම්පැළඳුම් සහ තවත් භාණ්ඩ කීපයක් නිවසෙන් පිටතට ගෙන ත්‍රිවිල් රථයකට දමාගෙන නිවසින් පිටවූ බවත්, ඉතිරි වූ භාණ්ඩ නිවසෙන් පිටත තබන ලෙස ඔවුන් එලෙස පිටව යන අවස්ථාවේ ඉල්ලුම් කර සිටි බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. එහෙත් එම අවස්ථාවේ දී පැමිණ සිටි පොලිස් නිලධාරීන් විසින් එසේ භාණ්ඩ නිවසෙන් පිටතින් තැබීම

ආරක්ෂාකාරී නොවන බැවින් පසුදින උදැසන එම ඉතිරි වූ භාණ්ඩ රැගෙන යන තෙක් එම බඩු නිවස තුළම රඳවා ගන්නා ලෙසට දැනුම් දුන් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. එසේම, එම අවස්ථාවේ දී එම නිවසේ යතුර චන්ද්‍රිකා කුමාරි යන අයගේ වැඩිමහල් දරුවා වන ඒ.කේ. ගයාන් නමැති අය පොලිස් නිලධාරීන් ඉදිරියේදී තමා හට භාරදී නිවසෙන් පිටවූ බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

තවද, ඊට පසුදින එනම්, 2024.02.26 වන දින එම නිවසේ ප්‍රධාන දොරෙහි දොරගුළු ලෑමේදී ගැටලුකාරී තත්ත්වයක් මතු වූ බැවින් එම දොරගුළු ගලවා නැවත සකස් කිරීම සඳහා වඩුකාර්මිකයෙක් කැඳවාගෙන ඒම සඳහා තමා පිටත්ව ගිය බවත්, එලෙස නිවසින් බැහැරව සිටි අවස්ථාවේදී එනම්, 2024.02.26 දින ප.ව. 01.00ට පමණ බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මංජුල රුවන්තිලක මහතා තම නිවසට පැමිණ ඒ වනවිට නිවසේ රැඳී සිටි තම මව සහ නැගණියට බැන තර්ජනය කර නිවසේ වසා තිබූ කාමරවල දොරවල් විවෘත කරන ලෙස තර්ජනය කර ඇති බවත්, එම කාමරවල යතුරු ඔවුන් ළඟ නොමැති බව තම මව සහ නැගණිය විසින් ස්ථානාධිපතිවරයාට පවසා ඇති බවත්, ස්ථානාධිපතිවරයා නිවසට පැමිණ ඇති බව තමා හට දුරකථනයෙන් අමතා නැගණිය විසින් දන්වා සිටි බවත්, එම දැනුම්දීම අනුව විනාඩි 45 ක පමණ කාලයකින් තමා නිවසට පැමිණි බවත්, එම නිවසේ වසා තිබූ දොරවල් ස්ථානාධිපතිවරයා හා ඒ.කේ. ගයාන් යන අය විසින් පයින් ගසා කඩා විවෘත කළ බව තම නැගණිය සහ මව විසින් තමා හට ප්‍රකාශ කළ බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එම අවස්ථාවේදී තමා විසින් පොලිස් ස්ථානාධිපතිවරයා වෙතින් ඔහු පැමිණි කාරණය විමසූ විට ඔහු පවසා සිටියේ නිවසේ තිබූ භාණ්ඩ කීපයක් තමා විසින් සොරකම් කර ඇති බවයි. එසේ පවසා නිවසේ යතුර ඒ.කේ. ගයාන් නමැති යන අය හට ලබා දෙන ලෙසට තර්ජනය කළ බවත්, එසේ බලහත්කාරී ලෙස ඉහත කී චන්ද්‍රිකා කුමාරි යන අය සහ ඇයගේ දරුවන් දෙදෙනා ස්ථානාධිපතිවරයා විසින් එම නිවසේ පදිංචි කරවූ බවත්, තමාගේ ටී ෂර්ට් එකේ කොළරයෙන් අල්ලාගෙන තමා සතු ජංගම දුරකථනයෙන් ස්ථානාධිපතිවරයා කරන ප්‍රකාශයන් පටිගත කරනවා යයි පවසමින් තමාගේ දුරකථනය උදුරාගෙන තමාව පොලිස් ජීප් රථයට තල්ලු කර අතින් පහර කීපයක් තමාගේ බඩට සහ ඉළඇට ප්‍රදේශයට එල්ල කරන ලද බවත්, විනාඩි දහයක පමණ කාලයක් තුළදී තමා බුලත්කොහුපිටිය පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවත් පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත. එසේම, තමා පොලිස් ස්ථානය වෙත රැගෙන ආ අවස්ථාවේදී එම ස්ථානයේ සිටි සියලු දෙනා ඒ බව දුටු බවත්, තමා එම ප්‍රදේශයේ සිටින ගෞරවය දිනාගත් සාමවිනිසුරු තනතුරක් දරන පුද්ගලයෙකු බැවින් මෙම සිදුවීමෙන් තමාගේ ගෞරවය හා කීර්තිය කෙරෙහි දැඩි ලෙස බලපෑමක් එල්ල කර ඇති බවත් පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

තවද, තමාව බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයට රැගෙන ගිය පොලිස් ස්ථානාධිපතිවරයා එහි සිටි පොලිස් නිලධාරිනියක හට තමාව සිර මැදිරිය වෙත ඇතුලු කරන ලෙස උපදෙස් දුන් බවත්, ඒ අවස්ථාවේදී එම නිලධාරිණිය ඒ සඳහා පසුබට වනවිට නැවතත් සිරමැදිරියට යොමු කරන ලෙස

පවසා එම ස්ථානයෙන් පිටත්ව ගිය බවත්, ඒ අනුව තමාව පැයක් පමණ සිර මැදිරියේ රඳවා සිටි බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී ස්ථානාධිපති විසින් පොලිස් ස්ථානය වෙත පැමිණ සිටි නිවසේ ඒ වනවිට රැඳී සිටි චන්ද්‍රිකා කුමාරි හා තරුෂ අතුකෝරල යන අයගෙන් නැතිවූ භාණ්ඩ හමුවූවාදැයි විමසා සිට ඇති බවත්, එවිට එම අය එම භාණ්ඩ නිවසේ ගබඩා කාමරය තුළ තිබූ බවට ප්‍රකාශ කර ඇති බවත් සඳහන් කර ඇත. මෙහිදී තමා ස්ථානාධිපතිවරයාට මෙම පැමිණිල්ල බොරු පැමිණිල්ලක් බවත්, තමා කිසිදු අවස්ථාවක ඒ අයගේ කිසිදු භාණ්ඩයක් සොරකම් කර නොමැති බවට ප්‍රකාශ කළ බවත්, එවිට ස්ථානාධිපතිවරයා "වැඩිය කට ගහන්න එන්න එපා. එහෙම දැඟලුවොත් ඔය රස්සාවත් නැති කරලා දානවා. කුඩු හෝ ගංජා ඇති බවට පැමිණිල්ලක් දමා හෝ මෙම නිවසේ සිටි ගෑනු කෙනා ඇඳුම් ඉරාගෙන පොලිසියට පැමිණ පැමිණිල්ලක් කළහොත් උඹට ආයේ ගැලවීමක් නැතැයි" පැවසූ බවත්, එසේ පවසමින් නැවත තමා සිරකුඩුව වෙත දැමීමට නියෝග කළ බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. මෙම සිද්ධිය සිදුවීමෙන් පසු එදිනම එනම්, 2024.02.26 දින තම සහෝදරයකු පොලිස් ස්ථානය වෙත පැමිණ තමා පොලිස් භාරයෙන් ඇප මත නිදහස් කරගත් බවත්, තමාට 2024.03.02 දින කෑගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටීමට නියම කරන ලද බවත්, එම අවස්ථාවේදී බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වන වගන්තිය යටතේ නඩු පවරන බව පවසා තමාගෙන් බැඳුම්කරයකට අත්සන් ලබාගත් බවත් පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

වගඋත්තරකාර බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් අංක OIC/OW/835/24 හා 2024.06.16 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව මගින් ප්‍රකාශ කර ඇත්තේ, උක්ත පැමිණිලිකාර පාර්ශවය වන පී.ජී.ආර්.එස්. බණ්ඩාර යන අය පැමිණිලි සටහන් කිරීමට හා පැමිණිලි විභාග කිරීම සඳහා විවිධ අවස්ථාවන්හිදී පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති බවට පොලිස් ස්ථානයේ පවත්වාගෙන යනු ලබන ලේඛන මගින් අනාවරණය වන බවයි. එහිදී ස්ථානාධිපතිවරයා වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස ඔහු විසින් කිසිවිටෙකත් නිල බලය අයුතු ලෙස උපයෝගී කරගැනීමක් හෝ කිසිඳු සිවිල් පුරවැසියෙකුගේ අයිතිවාසිකම් කඩවන ආකාරයකට කටයුතු කිරීමක් සිදු කර නොමැති බවත්, මෙම පැමිණිලිකරු ප්‍රකාශ කරන පරිදි පහරදීමක් හෝ අත්අඩංගුවට ගැනීමක් සිදු කර නොමැති බවත් ය. 2024.02.26 දින හෝ ඊට ආසන්න දිනයකදී පැමිණිලිකරු පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන ඇත්දැයි ලේඛන පරීක්ෂා කර ඇති බවත්, එම ලේඛනයන්හි සඳහන් කරුණු අනුව උක්ත පැමිණිලිකාර පාර්ශවය කිසිඳු අවස්ථාවක තම පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගෙන ඇති බවට කරුණු අනාවරණය නොවන බවත් එම වාර්තාව මගින් වගඋත්තරකාර පාර්ශවය වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

එසේම, මෙම පැමිණිල්ලට අදාළව 2025.01.07 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැවැත් වූ පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, 2024.02.26 වන දින පැය 12.40ට පමණ තම පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොත් වල එනම් CIB i208/228 යටතේ නිවසකට ඇතුළු වී භාණ්ඩ සමඟ එළියට පන්නා දැමීමක් සම්බන්ධයෙන් දූනුමාලේ මුදියන්සේලාගේ චන්ද්‍රිකා කුමාරි දූනුමාලේ යන E239/2, සූරියමල්ගම, උඩුගොඩ ලිපිනයේ පදිංචි අය විසින් තම පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, එම පැමිණිල්ල මගින් එහි පැමිණිලිකාරිය විසින් බන්දුල සමරසිංහ බණ්ඩාර යන මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු හා තවත් කිහිපදෙනෙකු එකී පැමිණිලිකාරියගේ නිවසට පැමිණ නිවසේ යතුරු බලහත්කාරයෙන් ලබාගෙන කලබලයක් සිදුකර ඇති බවට පැමිණිලි කර ඇති බවයි. එහිදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කර ඇති පැමිණිල්ලෙහි පැමිණිලිකාර පාර්ශවය වන බන්දුල සමරසිංහ යන අය හා තවත් පිරිසක් විසින් විසින් දූනුමාලේ මුදියන්සේලාගේ චන්ද්‍රිකා කුමාරි දූනුමාලේ යන අය හා ඇයගේ දරුවන් දෙදෙනා බලහත්කාරයෙන් එම නිවසෙන් පන්නා දැමීමට කටයුතු කළ බවත්, කලහකාරී ලෙස කටයුතු කරමින් නිවසේ දොරාගුළු කඩා දමා ඇති බවත් එම පැමිණිල්ල මගින් වැඩිදුරටත් ප්‍රකාශ කර තිබූ බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත. මෙහිදී අදාළ නිවසේ සමගිය හා කුඩා දරුවාගේ අධ්‍යාපන කටයුතු වලට හා ආරක්ෂාවට තර්ජනයක් ඇතිවිය හැකි බැවින් තමා එම ආරාවුලට හේතු වූ ස්ථානය වෙත ගිය බවත්, එහිදී බන්දුල නමැති අය තම ජීප් රථය වෙත පැමිණි අවස්ථාවේදී ජීප් රථයට නඟින්න යැයි පවසා පොලිස් ස්ථානය වෙත කැඳවාගෙන ආ බවත්, අනෙක් පාර්ශවයන් හට පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට දැනුම් දුන් බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත. එසේම, එම අවස්ථාවේදී උක්ත පැමිණිලිකාර පාර්ශවය වෙත කිසිදු ආකාරයක පහරදීමක් සිදු නොකර ඇති බව හා බලහත්කාරයෙන් ජීප් රථයට නංවාගෙන පොලිස් ස්ථානය වෙත ගෙන ගොස් නොමැති බවත්, පැමිණිලිකරු සිය කැමැත්තෙන්ම පොලිස් ජීප් රථයෙන් පොලිස් ස්ථානය වෙත රැගෙන ආ බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**<u>නිරීක්ෂණ</u>**

බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ CIB 1 ලේඛනයේ 2024.02.26 වන දින පැය 12.40ට, පිටුව 208, ඡේදය 228 යටතේ යොදා ඇති සටහන අනුව "නිවසට ඇතුළුව භාණ්ඩ සමග එළියට පන්නා දැමීමක්" යනුවෙන් දූනුමාලේ මුදියන්සේලාගේ චන්ද්‍රිකා කුමාරි දූනුමාලේ යන අය විසින් සිදු කරන ලද පැමිණිල්ලක් සටහන් කර ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

එසේ වුවද, ඉහත කී දූනුමාලේ මුදියන්සේලාගේ චන්ද්‍රිකා කුමාරි දූනුමාලේ යන අය විසින් පොලිස් ස්ථානය වෙත කර ඇති පැමිණිල්ලේ, කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු හා තවත් පුද්ගලයින් කිහිපදෙනෙකු සම්බන්ධයෙන් පැමිණිලි කර ඇතත්, බුලත්කොහුපිටිය පොලිස් ස්ථානය මගින් එම පැමිණිල්ල විභාගයට ගැනීමේදී මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන පී.ජී.එස්. බණ්ඩාර යන අයගෙන් පමණක් ප්‍රකාශ ලබා ගෙන ඇති බව නිරීක්ෂණය

වේ. ඒ අනුව ඉහත කී දුනුමාලේ මුදියන්සේලාගේ චන්ද්‍රිකා කුමාරි දුනුමාලේ යන අය විසින් සිදු කරන ලද පැමිණිල්ලට අදාළව බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ CIB 1හි 2024.02.26 වන දින පැය 19.30ට පිටුව 342 සහ ඡේදය 252 යටතේ පැමිණිලිකාර පී.ජී.ආර්.බී.එස්. බණ්ඩාර යන අයගෙන් ප්‍රකාශයක් සටහන් කර ගෙන ඇත.

පැමිණිලිකරු 2024.04.15 වන දින කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2024.02.26 වන දින දහවල් 12.00ට පමණ උඩුගොඩ, සූරියමල්ගම, E 239/2 ලිපිනයේ පිහිටි නිවසේ තමා නොසිටි අවස්ථාවකදී බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා එම නිවසට පැමිණ තමාගේ මවට, තම සොහොයුරිය හා ඇයගේ යෙහෙලියක වන කුමුදුනී ධර්මවංශ යන අයටද බැණ තර්ජනය කර නිවසට ඇතුළුවී නිවසේ වසාතිබූ දොරවල් වලට පයින් ගසා කඩා ඒ.කේ. ගයාන් නමැති දරුවාටද එසේ දොරවල් වලට පයින් ගසා විවෘත කරන ලෙස උපදෙස් ලබාදී ඇති බවත්, තමා ඉන්නා තැනකින් එම ස්ථානයට කැඳවන ලෙස ස්ථානාධිපතිවරයා විසින් දැනුම් දී ඇති බවත් ය.

තවද, පැමිණිලිකරු විසින් සාක්ෂි වශයෙන් දිවුරුම් ප්‍රකාශ හතරක් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති අතර, පැමිණිලිකරුගේ සහෝදරයකු වන පැල්පිට ගමරාළලාගේ මංජුල සමන්ප්‍රිය බණ්ඩාර යන අය 2024.04.10 වන දිනැතිව ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත්තේ, තම සහෝදරයා වන පී.ජී.ආර්.බී.එස්. බණ්ඩාර යන අය 2024.02.26 දින සොරකමක් සම්බන්ධයෙන් යැයි පවසා බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් පහරදී රැගෙන ගිය බවත්, එම අවස්ථාවේදී එකී ස්ථානයේ රැඳී සිටි තමාගේ සහෝදරිය වන අරුණා චාන්දනී කුමාරි යන අය තමා හට දුරකථන මාර්ගයෙන් ඒ බව දැනුම් දුන් බවත් ය. පැමිණිලිකරුගේ තවත් සහෝදරයකු වන චමින්ද සනත් බණ්ඩාර යන අය සමග බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයට ගොස් පොලිස් නිලධාරීන් වෙතින් අත්අඩංගුවට ගැනීම සම්බන්ධව විමසා සිටි බවත්, එහිදී පොලිස් ස්ථානයේ සිටි නිලධාරියකු විසින් තම සහෝදරයා පොලිස් සිර මැදිරියක් තුළ සිටින බවට කළ දැනුම්දීම අනුව එම නිලධාරියාගේ අවසරය මත සිරමැදිරිය ළඟට ගොස් තම සහෝදරයාට කතා කළ බවත්, පසුව අත්අඩංගුවට ගැනීමට හේතුව කුමක්ද යන්න පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගෙන් විමසූ බවත්, සොරකමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් බවට පොලිස් ස්ථානාධිපතිවරයා විසින් එම අවස්ථාවේ ප්‍රකාශ කළ බවත්, එහිදී තම අනෙක් සහෝදරයා වන චමින්ද සනත් බණ්ඩාර යන අය බැඳුම්කරයකට අත්සන් තබා පැමිණිලිකාර පී.ජී.ආර්.බී.එස්. බණ්ඩාර යන අය පොලිස් ඇප මත එදින එනම්, 2024.02.26 වන දින පස්වරු 7.30 ට පමණ පොලිස් ස්ථානයෙන් මුදාහැර ඇති බවත් පැල්පිට ගමරාළලාගේ මංජුල සමන්ප්‍රිය බණ්ඩාර යන අය 2024.04.10 වන දිනැතිව ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශය මගින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එසේම, දිසානායක මුදියන්සේලාගේ කුමුදුනී ධර්මවංශ යන අය විසින් 2024.04.24 දිනැතිව ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රකාශ කර ඇත්තේ, තමා 2024.02.26 වන දින උඩුගොඩ සූරියමල්ගම පදිංචිව සිටින අරුණා චාන්දනී කුමාරි යන අයගේ මවගේ සුව දුක් බලා ඒම සඳහා

අරුණා චාන්දනී යන අය සමඟ එකී නිවසට ගිය බවත්, එම නිවසේ සිටින අවස්ථාවේදී පස්වරු 12.00 ට පමණ හදිසියේ පැමිණි බුලත්කොහුපිටිය පොලිස් ස්ථානාධිපතිවරයා බන්දුල ඉන්නවාදැයි විමසා සිටි බවත්, එවිට ඔහු කෑගල්ල නගරයට ගිය බව බන්දුලගේ මව පවසා සිටි බවත්, ඉන්පසු බන්දුල යන අය එම ස්ථානයට කැඳවන ලෙස පොලිස් ස්ථානාධිපතිවරයා පවසා සිටි බවත් ය. ඒ අනුව අරුණා චාන්දනී යන අය දුරකථන ඇමතුමක් ලබාගෙන ස්ථානාධිපතිවරයා නිවස වෙත පැමිණ සිටින බවට බන්දුල යන අය වෙත දැනුම් දුන් බවත්, එම අවස්ථාවේදී බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා තමා හට හා අරුණා චාන්දනී යන අය හට නිවසෙන් පිටව යන ලෙස තර්ජනය කළ බවත්, එම නිවසෙන් පිටව නොගියහොත් තමන් සියලුදෙනා අත්අඩංගුවට ගන්නා බව පවසා නිවසේ වසා තිබූ දොරවල් වලට පයින් ගැසූ බවත්, එම ස්ථානයේ සිටි ඒ.කේ. ගයාන් නමැති ළමයාට ද පයින් ගසා දොරවල් විවෘත කරන ලෙස පවසා සිටි බවත් සඳහන් කර ඇත. ඒ අනුව එම අවස්ථාවේ තමා බියට පත්ව අසල පිහිටි නිවසකට ගොස් නැවත අදාළ නිවස වෙත බන්දුල යන අය පස්වරු 1.00ට පමණ එම නිවසට පැමිණි පසු එහි ගිය බවත්, ඒ අවස්ථාවේදී පොලිස් ස්ථානාධිපතිවරයා බන්දුල යන අයට මහත් උස් හඬින් බැන තර්ජනය කර නිවසේ යතුරු ඉල්ලාගෙන එය ඒ.කේ. ගයාන් නමැති පිරිමි දරුවාට ලබා දී නිවසේ පදිංචිව සිටින ලෙස ඔවුන්ට දන්වා බන්දුල යන අයව පස්වරු 1.15ට පමණ පහරදී පොලිස් ජීප් රථයේ දමාගෙන නිවසෙන් පිටත්ව ගිය බවත් දිසානායක මුදියන්සේලාගේ කුමුදුනී ධර්මවංශ යන අය විසින් 2024.04.24 දිනැතිව ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය මගින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

එසේම, පහරදීම හා අත්අඩංගුවට ගැනීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවයේ ඥාතියකු වන නිකපිටිය ආරච්චිලාගේ නන්දාවතී යන අය විසින් 2024.04.24 දිනැතිව ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා ඇත්තේ, බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් පැමිණිලිකාර පී. ජී.ආර්.බී.එස්. බණ්ඩාර යන අය වෙත පහරදීමක් සිදුකොට ඔහුව පොලිස් ජීප් රථය වෙත තල්ලුකර ජීප් රථයේ නංවාගෙන පස්වරු 1.15 ට පමණ පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවයි.

කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවය විසින් 2024.06.16 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව පැමිණිලිකාර පාර්ශවය අත්අඩංගුවට ගැනීමක් සිදු කර නොමැති බවට කරුණු දක්වා තිබුණද, කොමිෂන් සභාව ඉදිරියේ 2025.01.07 වන දින පැවති පරීක්ෂණයේදී වගඋත්තරකාර පාර්ශවය විසින් ඉහත කී චන්ද්‍රිකා කුමාරි යන අයගේ පැමිණිල්ල මත පැමිණිලිකාර පාර්ශවය පොලිස් ජීප් රථයට නංවාගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බව පිළිගෙන ඇත.

පැමිණිලිකාර පාර්ශවය විසින් තමා වෙත වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපතිවරයා විසින් පහරදීමක් සිදුකර ඇති බවට පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇති නමුත්, පහරදීමට අදාළව තුවාල හෝ වෙනත් කිසියම් ආබාධ තත්ත්වයක් සඳහා ප්‍රතිකාර ලබා ගැනීමක් සම්බන්ධයෙන් වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර නොමැත. එසේ වුවද ඉහත කී පැල්පිට ගමරාළලාගේ මංජුල සමන්ප්‍රිය බණ්ඩාර, දිසානායක මුදියන්සේලාගේ කුමුදුනී ධර්මවංශ සහ නිකපිටිය ආරච්චිලාගේ නන්දාවතී යන අය විසින් ලබා දී ඇති දිවුරුම් ප්‍රකාශ ප්‍රකාරව පැමිණිලිකරු වෙත වගඋත්තරකාර පොලිස් ස්ථානාධිපතිවරයා විසින්

පහරදීමක් හා අත්අඩංගුවට ගෙන සිරගත කිරීමක් සිදුකර ඇති බවට අනාවරණය වේ. එසේම, බුලත්කොහුපිටිය පොලිස් ස්ථානය වෙත චන්ද්‍රිකා කුමාරි යන අය විසින් කර ඇති පැමිණිල්ල සම්බන්ධව වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකාර පාර්ශවයෙන් පමණක් ප්‍රකාශ සටහන් කරගෙන ඇති බවත්, ඒ අනුව ඉදිරි පියවර ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

එසේම, කිසියම් පොලිස් ස්ථානයක දෛනික සටහන් තැබීමේදී පොලිස් දෙපාර්තමේන්තු නියෝග පිළිපැදිය යුතු වන අතර, විවිධ කාරණයන් සම්බන්ධයෙන් කරුණු සටහන් කිරීම සඳහා වෙන්වූ විශේෂිත ලේඛන පවත්වාගෙන යාම සිදු කළ යුතු ය. ඒ අනුව පොලිස් නිලධාරියකු පොලිස් ස්ථානයෙන් කිසියම් රාජකාරී කටයුත්තක් සඳහා පිටව යන අවස්ථාවේදීත්, එකී රාජකාරිය අවසන් කොට නැවත ස්ථානය වෙත පැමිණි අවස්ථාවේදීත් ඊට අදාළ සටහන් පොලිස් ස්ථානයේ තොරතුරු පොත්වල සටහන් කළ යුතු ය. එහෙත් මෙම පැමිණිල්ලේ වගඋත්තරකාර පාර්ශවය වන බුලත් කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වන මංජුල රුවන්තිලක යන අය විසින් 2024.02.26 වන දින පොලිස් ස්ථානයෙන් බැහැරව යන විට හෝ නැවත පැමිණි විට හෝ පැමිණිලිකාර පී.ජී.ආර්.බී.එස්. බණ්ඩාර යන අය අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ආ අවස්ථාවේ දී හෝ පොලිස් ස්ථානයේ පවත්වාගෙන යන තොරතුරු පොත් වල ඊට අදාළ සටහන් විධිමත් පරිදි සටහන් කර නොමැති බව බුලත් කොහුපිටිය පොලිස් ස්ථානයේ තොරතුරු පොත් පරික්ෂා කිරීමේ දී අනාවරණය වී ඇත.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1) වගන්තිය මගින් වරෙන්තුවක් නොමැතිව පුද්ගලයින් අත්අඩංගුවට ගත හැකි අවස්ථා දක්වා ඇති අතර 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතී ද එවැනි යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකි බව සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධව ඉදිරිපත්ව කරුණු සැලකිල්ලට ගැනීමේදී අනාවරණය වන්නේ චන්ද් රිකා කුමාරි යන අය විසින් බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ 2024.02.26 දින සිදුකර ඇති පැමිණිල්ලට අනුව බුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වන මංජුල රුවන්තිලක යන අය විසින් පැමිණිලිකාර පී.ජී.ආර්.බී.එස්. බණ්ඩාර යන අය අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන විත් ඇති බව අනාවරණය වේ.ඒ බව පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොත් වල එනම් CIB ii හි මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන පී.ජී.ආර්.වී.එස්. බණ්ඩාර යන අයගෙන් පොලිස් නිලධාරීන් විසින් ලබා ගත් ප්‍රකාශය තුළින් ඒ බව සනාථ වේ. එම ප්‍රකාශය 2024.02.26 දින සහිතව, වේලාව 19.30, පිටුව-342 ,ඡේදය-252 යටතේ සටහන් කර ඇති බව ඉදිරිපත්වී ඇති ලේඛන මගින් දක්වා ඇත. මෙහිදී පොලිස් ස්ථානාධිපතිවරයා විසින් සිද්ධියට අදාළ සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කිරීමේදී ඒ සම්බන්ධව අනුගමනය කල යුතු විධිමත් ක්‍රියාපිළිවෙතින් බැහැරව ක්‍රියා

කිරීම මගින් මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන පී.ජී.ආර්.බී.එස්. බණ්ඩාර යන අයව අසාධාරණයකට ලක් කර ඇති බව නිරීක්ෂණය වේ.

එසේම, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අංක NPC/PCID/SG/KE/23/2024 සහ 2025.10.02 දිනැති ලිපිය මගින් උක්ත පැමිණිලිකරු වෙත දන්වා ඇති පරිදි මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත කර ඇති පැමිණිල්ලට අදාළව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් විමර්ශනයක් සිදු කර ඇති බවත්, ඒ අනුව පැමිණිල්ල මඟින් ඉදිරිපත් කර ඇති ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් සිවිල් අධිකරණය වෙත යොමු වී සහනයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, පැමිණිලිකාර පාර්ශවය අයුතු ලෙස අත්අඩංගුවට ගෙන අනීතික ලෙස රඳවා තබා ගත් බවට කර ඇති චෝදනා සම්බන්ධයෙන් සිදු කර ඇති මූලික විමර්ශනයේදී පොලිස් නිලධාරීන් ගෙන් අගතියක් සිදු වී ඇති බවටත් අනාවරණය කරගෙන ඇති බව දන්වා ඇත . එහිදී වගඋත්තරකාර ප්‍ර. පො. ප. මංජුල රුවන්තිලක නිලධාරියාට හා කා.පො.සැ. 4006 ඉන්ද්‍රාණි නිලධාරිණියට එරෙහිව චෝදනා පත්‍ර ලබා දීමට නිර්දේශ කර ඇති බවත් එම ලිපිය මගින් උක්ත පැමිණිලිකරු වෙත දන්වා ඇති බවට ගොනුව වෙත ඉදිරිපත්ව ඇති ලේඛන මඟින් නිරීක්ෂණය වේ.

එසේම, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ලබා දී ඇති අධිකරණ තීන්දු සැලකිල්ලට ගැනීමේදී පොලිස් අත්අඩංගුවට ගැනීම සම්බන්ධ කටයුතු කළයුතු ආකාරය පිළිබඳව මනා අවබෝධයක් ලබාගත හැකි අතර, මෙම පැමිණිල්ල කෙරෙහි එම නඩු සඳහා ලබාදුන් තීන්දු වැදගත් වන බව වැඩිදුරටත් නිරීක්ෂණය වේ.

<u>කපුගීකියනගේ</u> එදිරිව <u>හෙට්ටිආරච්චි සහ වෙනත් අය</u> (1984) 2 Sri L.R. 153 නඩුවේදී " අත්අඩංගුවට ගැනීමේදී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි සඳහන් නීතිය මගින් ස්ථාපිත කරන ලද ක්‍රියාපටිපාටිය හැර වෙනත් ක්‍රියාපටිපාටියක් යොදාගත නොහැක" යනුවෙන් දක්වා ඇත.

<u>ලන්දගේ ඉෂාරා අංජලී සහ විජේසිංහ චූලංගනී</u> එදිරිව <u>වරුණී බෝගහවත්ත සහ වෙනත් අය</u> (SCFR 677/2012) නඩුවේදී, "1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව අනුව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් නිදහස් වන අතර, යම් හෙයකින් නිදහස අහිමි කරන්නේ නම් නීතියෙන් ස්ථාපිත කර ඇති ක්‍රියාපටිපාටිය දැඩි ලෙස අනුගමනය කළ යුතු බවට නියෝග කරයි. මෙම ක්‍රියාපටිපාටියේ විධිවිධාන සකසා ඇත්තේ අභිමතය පරිදි හෝ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම වැළැක්වීට සහ පුද්ගල වාසි සහ දේශපාලන අරමුණු සඳහා අධිකරණ බලය අයුතු ලෙස භාවිත කිරීම වැළැක්වීමට" බව දක්වා ඇත.

නිගමනය

මෙම පැමිණිල්ල අනුව කොමිෂන් සභාව විසඳිය යුතු ගැටළුව වනුයේ මෙම අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කර ඇති ආකාරයට සිදුකර තිබේද නැත්ද යන්නයි. 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32 වගන්තිය අනුව සංඥය වරදක් කර ඇති අවස්ථාවකදී වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමක් සිදුකළ හැකි නමුත්, වරෙන්තුවක් නොමැතිව යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගන්නේ නම්, නිසි පැමිණිල්ලක්, නිසි තොරතුරක් සහ සාධාරණ සැකයක් තිබිය යුතු අතර, එය විමර්ශන නිලධාරියා විසින් විමර්ශනයකට ලක් කොට තහවුරු කර ගැනීමෙන් පසුව අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකළ යුතු ය. එබැවින් පැමිණිල්ලට අදාළ වගඋත්තරකාර පාර්ශවය වන මුලත්කොහුපිටිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වන ප්‍රධාන පොලිස් පරීක්ෂක මංජුල රුවන්තිලක යන අය උක්ත පැමිණිල්ල විභාග කිරීමේදී තම බලය ඉක්මවා භාවිතා කර ඇති බව ගොනුව වෙත ඉදිරිපත්ව ඇති කරුණු අනුව අනාවරණය වේ.

එසේ හෙයින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු අත්අඩංගුවෙහි රඳවා තබා ගැනීම සිදු නොකළ යුතු ය, යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ. තවද, අත්අඩංගුවට ගැනීමකදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටියට ඇතුලත් 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ ප්‍රතිපාදන අනුගමනය නොකිරීම තුලින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකමද වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇති ආකාරයට අදාළ වගඋත්තරකරුට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන ඇත්ද යන්න පොලිස්පතිවරයා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දිය යුතු ය.

2026. 03 .12 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පතිවරයා වෙත දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා